# ජාතික ලොතරැයි මණ්ඩලය

## මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

# ඇබෑර්තු

## ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලබයි

### නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) HM 1-1

**සුදුසුකම් හා පළපුරුද්ද :**

01. අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත්, (පරිගණක විද්‍යා, පරිගණක ඉංජිනේරු, තොරතුරු විද්‍යා හෝ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයක) ප්‍රථම උපාධියක්,

සමග

ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් (තොරතුරු පද්ධති, ජාලකරණ හා ජාල ආරක්ෂණ, වෙබ් පාදක තාක්ෂණ, දත්ත සමුද්‍ර පද්ධති, මැපිං (Mapping) හා දත්ත ආරක්ෂණය විෂය ක්ෂේත්‍රයක) පශ්චාත් මාස්ටර්ස් උපාධියක් (පර්යේෂණ ආචාර්ය උපාධි නිබන්ධන සහිත) සහ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

සහ

ඇ) තනතුරට අදාළව, (පරිගණක විද්‍යා, පරිගණක ඉංජිනේරු, තොරතුරු විද්‍යා හෝ තොරතුරු තාක්ෂණ විෂය ක්ෂේත්‍රයක) සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකරණ තලයේ"** අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද.

02. අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් (පරිගණක විද්‍යා, පරිගණක ඉංජිනේරු, තොරතුරු විද්‍යා හෝ තොරතුරු තාක්ෂණ) ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්

සමග

ආ) තනතුරට අදාළව, (තොරතුරු පද්ධති, ජාලකරණ හා ජාලකරණ ආරක්ෂණ, වෙබ් පාදක තාක්ෂණ, දත්ත සමුද්‍ර පද්ධති මැපිං (Mapping) හා දත්ත ආරක්ෂණ) ක්ෂේත්‍රයක, පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය,

සහ

ඇ) තනතුරට අදාළව (පරිගණක විද්‍යා, පරිගණක ඉංජිනේරු, තොරතුරු විද්‍යා හා තොරතුරු තාක්ෂණ) විෂය ක්ෂේත්‍රයක, සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක, **"කළමනාකරණ තලයේ"** අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද.

- **වයස :** අවුරුදු 35 – 55 අතර
- **වැටුප් පරිමාණය :** HM 1-1 රුපියල් 80,295 - 15 x 2,270 = 114,345/-

**තෝරා ගත් අයදුම්කරුවන්හට,**

වාහනයක් + ඉන්ධන
මාසික දිරි දීමනාවක්
වාර්ෂික ප්‍රසාද දීමනා
වෛද්‍ය රක්ෂණය
අනුමත කළ අනෙකුත් දීමනා (චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව),
ආදියද ඇතුළත්ව හා වැටුපට අමතරව, ආකර්ෂණීය ප්‍රතිලාභ පැකේජයක් හිමිවේ.

### සහකාර / සාමාන්‍යාධිකාරී (නීති හා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්) MM 1-1

**සුදුසුකම් හා පළපුරුද්ද :**

අයදුම්කරු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හා දිවුරුම් කොමසාරිස්වරයකු විය යුතු අතර, නීති හෝ ප්‍රසිද්ධ ආයතනයක, වාණිජ නෛතික කටයුතු, නඩු කටයුතු, නොතාරිස් හා සමාගම් ලේකම් කටයුතු ආදිය සම්බන්ධව කටයුතු කොට අවම වශයෙන් වසර 05 ක පශ්චාත් සුදුසුකම් වෘත්තීය පළපුරුද්දක් තිබිය යුතුය. එසේම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් නීති ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් ලබා තිබීම අමතර සුදුසුකමක් වේ.

- **වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.
- **වැටුප් පරිමාණය :** MM 1-1 රුපියල් 53,175 - 10 x 1,375 - 15 x 1,910 = 95,575/-
- **තෝරාගත් අයදුම්කරුවන්හට,**
  මාසික දිරිදීමනා
  වාර්ෂික ප්‍රසාද දීමනා
  වෛද්‍ය රක්ෂණය
  අනුමත කළ අනෙකුත් දීමනා (චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව)
  ආදියද ඇතුළත්ව හා වැටුපට අමතරව, ආකර්ෂණීය ප්‍රතිලාභ පැකේජයක් හිමිවේ.

### සහකාර / සාමාන්‍යාධිකාරී (මූල්‍ය) MM 1-1

**සුදුසුකම් හා පළපුරුද්ද :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ගිණුම්කරණ හා මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සහ රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක, ගිණුම්කරණ හා මූල්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් සුදුසුකම් ලැබීමෙන් පසු, වසර 01 ක පළපුරුද්ද.

02. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CASL) අන්තර් මධ්‍ය තලයේ සුදුසුකම් හෝ කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ (CIMA) අන්තර් මධ්‍ය තලයේ සුදුසුකම් හෝ සහතිකලත් හා ආයතනික ගණකාධිකාරී සංගමයේ (ACCA) අන්තර් මධ්‍ය තලයේ සුදුසුකම් හෝ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව සමග රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක ගිණුම්කරණ හා මූල්‍ය ක්ෂේත්‍රයේ, සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.

- **වයස :** අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.
- **වැටුප් පරිමාණය :** MM 1-1 රුපියල් 53,175 - 10 x 1,375 - 15 x 1,910 = 95,575/-
- **තෝරාගත් අයදුම්කරුවන් හට**
  මාසික දිරි දීමනා
  වාර්ෂික ප්‍රසාද දීමනා
  වෛද්‍ය රක්ෂණය
  අනුමත කළ අනෙකුත් දීමනා (චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව)
  ආදියද ඇතුළත්ව හා වැටුපට අමතරව, ආකර්ෂණීය ප්‍රතිලාභ පැකේජයක් හිමිවේ.

- ඉංග්‍රීසි භාෂාව පිළිබඳව මනා සාක්ෂරතාවයක් සතු වීම අමතර සුදුසුකමක් වේ.
- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු අතර, මනා චරිතයකින් යුක්ත විය යුතුය.
- සියලු ජීව දත්ත ඇතුළත් වූ තමා විසින්ම පිළියෙළ කර ගත් අයදුම්පත්, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක සහිතව හා සියලු සහතිකවල පිටපත් ඇතුළත්ව, ලියාපදිංචි තැපෑලෙන්, අදාළ භාර ගැනීම අවසන් කරනු ලබන දිනයට පෙර, **සභාපති, ජාතික ලොතරැයි මණ්ඩලය, අංක 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.** යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.
- අයදුම්කරනු ලබන තනතුර, අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.
- රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන / දෙපාර්තමේන්තු ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.
- අයදුම්පත් භාර ගැනීම 2020.09.02 දින අවසන් කෙරේ.
- අදාළ අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
- මෙම ඇබෑර්තු සම්බන්ධයෙන් 2020.01.30 දින "ඩේලි නිව්ස්" පුවත්පතෙහි පළකරන ලද දැන්වීමට ප්‍රතිචාර දක්වා අයදුම් කළ අයවලුන් නැවත අයදුම් කළ යුතු නැත. එම අයදුම්පත්, සම්මුඛ පරීක්ෂණ සඳහා පිළියෙළ කිරීම සඳහා වලංගු වේ.
- මේ සම්බන්ධයෙන් ඕනෑම අයුරකින් බලපෑම් සිදු කිරීම, නුසුදුසුකමක් ලෙසට සැලකීමට සිදුවනු ඇත.
- මේ සම්බන්ධයෙන් තෝරා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ හා බඳවා ගැනීම් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනු ඇත.

**සභාපති,**
**ජාතික ලොතරැයි මණ්ඩලය,**
**අංක 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්.ජේ. මුදලිගේ මාවත,**
**කොළඹ 01.**